16 වන පිටෙන්

නමක් ලෙස කතුවරයා කර ඇතේ ඇයගේ සොහොයුරාගේ පවුල වෙත පාඨක අවධානය යොමු කරවීමයි. විවාහ වී බිරිය හා දරුවන් දෙදෙනා ද සමග දිවි ගෙවන ඇනාගේ සොහොයුරා ගෙන ගිය අසම්මත ප්‍රේම සම්බන්ධය නිසා සිය බිරිය පත් වී සිටින දුක්ඛිත මානසික තත්වය නිරූපණය මගින් මුලින්ම පාඨක සිත් තුළ දනවන්නේ කාන්තාවකගේ අසරණ බවයි.

"------ ඇයට එය අසීරු දෙයකි. එසේම මේ වහල යට රැඳීම එයටත් වඩා අසීරුය. ------ කුටුම්බය හැරදා යන බව පුනපුනා කීවත් ඇයට එය කළ නොහැකිය. ඔහු තවමත් ඇගේ සැමියාය. ඇය තවමත් ඔහුට ප්‍රේම කරන්නීය.-----"

ඇනා කැරනිනා, පරිවර්තනය, ස්වර්ණකාන්ති රාජපක්ෂ - 11 පිට

විශ්ව සමාජය තුළ විවාපත්ව දිවි ගෙවන බොහෝ කාන්තාවන්ට ජීවිතයේ කවර හෝ අවස්ථාවක මුහුණ දෙන්නට සිදු වන සංකීර්ණ, ගැටලුකාරී මානසික තත්වයක් ටෝල්ස්ටෝයි මෙගිදී මැනවින් නිරූපණය කර ඇත. දරු දෙදෙනා හා සැමියා සමග එක වහල යට ජීවත් වන වංශවත් කාන්තාවක වන ඩොලිට තම සැමියාගේ ඇඳුම බැඳුම අන් ගැහැනියක වෙත ද යොමු වී ඇත යන පුවත දරාගත නොහැකි මානසික වේදනාවකි. බොහෝ සාම්ප්‍රදායික සමාජයන් තුළ මෙවැනි අසරණ තත්වයකට පත්වන ගැහැනියකගේ ඊළඟ තීරණය දරුවන් ද සමග තම දෙමාපියන් වෙත යාමය. ශ්‍රී ලාංකික සමාජය තුළ වුවද මෙවැනි තත්වයන් උද්ගත වීම විරල නොවේ. ඩොලි ගෙන ඇති මෙම තීරණය ක්‍රියාවට නොතැංවෙන්නේ, තම නෑනණ්ඩිය, එනම් සැමියාගේ සොයුරිය තම නිවසට පැමිණීමේ අවස්ථාව හේතු කොටගෙනය.

නවකතාව ආරම්භයේ පටන්ම කතුවරයාගේ විශේෂ අවධානය මෙන්ම දයාව ද, මෙවන් අසාධාරණකම්වලට ගොදුරු වන කාන්තා චරිත වෙත යොමු වන ආකාරය දැකගත හැකිය. ඩොලි කෙරෙහි පාඨක හදවත උණු වන ආකාරයට චරිතවල හැසිරීම, අන්‍යෝන්‍ය සම්බන්ධතා ආදිය ගළපාලන්නට ටෝල්ස්ටෝයි සමත් වී ඇති ආකාරය සැබවින්ම අපූරුය. ජීවිතය පුරාම ගැහැණුන් හා මිනිසුන් මුහුණදෙන අත්දැකීම්වලදී එක් පාර්ශවයකට පමණක් දොස් පවරා සිටීමට තරම් පටු අදහස් ටෝල්ස්ටෝයි තුළ නොමැත. තම බිරිඳට කළ අකාරුණික, අයහපත් වංචනික දේ ගැන ඩොලිගේ සැමියා, ඔබ්ලොන්ස්කි දුක් වන හා පසුතැවෙන ආකාරය කතුවරයා කදිමට නිරූපණය කරයි.

"ඩොලි." ඔහු ඉකි බින්දේය. "දෙවියන්ගෙ ණාමෙන් මේ දරුවො ගැන හිතන්න. දරුවො මේවට පළි නැහැ. මමයි වැරදි. මට දඬුවම් දෙන්න. මේ වැරැද්ද හරිගස්සන්න හැටි මට කියලා දෙන්න.-----"

ඇනා කැරනිනා, පරිවර්තනය, ස්වර්ණකාන්ති රාජපක්ෂ - 12 පිට

පවුල් ජීවිතය තුළ ගැහැනිය අසරණ තත්වයකට පත් වන අවස්ථා අනුවේදනීය ලෙස නිරූපනය කරන්නට සමත් වන ලියෝ ටෝල්ස්ටෝයි ඒ සමග එබඳු වැරදි ක්‍රියාවන්ට පෙළඹෙන ස්වාමිපුරුෂයන්ගේ මනස ද පාඨක අප ඉදිරියේ විවිර කරන්නේ ජීවිතය පිළිබඳව, නිර්මාණ කරුවකු වශයෙන් ඔහු ලබා ඇති පුළුල් දැනීම හා අත්දැකීම අැසුරෙනි. මිනිසුන් හා ගැහැනුන් සැම විටම සර්වතිර්දෝෂී පුද්ගලයන් නොවන බව එක් විටෙකත්ඒ කෙසේ වෙතත් එවන් සංකීර්ණ ගැටලු මධ්‍යයේ වඩාත් අසරණ වන්නේ කාන්තාව බවත් ටෝල්ස්ටෝයි කියා පාන්නේ ඒ පිළිබඳ පුළුල් ද දර්ශනයක් මතු කරලමිනි.

සිය සොහොයුරාගේ සහ නෑනණ්ඩියගේ පවුල් අවුල් විසඳන්නට එහි පැමිණෙන ඇනා කැරනිනා මෙම නව කතාව පුරාම අපට හමුවන ප්‍රධාන කාන්තා චරිතයයි. වංශවත්, උසස් නිලධාරියකු සමග උදය ගෙවන පවුල් ජීවිතය තුළ, අදය පතන සැබෑ ආදරය සිඳී ගොස් ඇත. තම බිරිඳට කෘතිම ලෙස පළ කරන ආදරයත් සමග තමන් ලබා ඇති උසස් සමාජ ගෞරවය හා තත්වය ආරක්ෂා කරගැනීමට සිය කුටුම්බයද රැකගත යුතු බව විශ්වාස කරන සැමියා වන කැරනින් බිරිඳ ඉදිරියේ



හැසිරෙන ආකාරය නවකතා කරුවා දක්වන්නේ විටෙක පාඨක මුව'ගට සිනාවක් නංවමින් වුවද ඒ සමගම අප තුළ මතු වන මානව දයාවෙන් බිඳක් ද එහි තවරමිනි.

තම සැමියා සමග ගෙවන කෘතිම ජීවිතය තුළ ඇය පතන සැබෑ ආදරයේ පිනි පොදක් ඇය මත පතිත වන්නේ තම සොහොයුරා වෙත දුම්රියෙන් යන ගමන කෙළවරේදීය. රොන්ස්කි නම් වූ කඩවසම් හමුදා නිලධාරියාගේ දෑස් තම දෑස් හා ගැටෙන මොහොතේ දෙදෙනාගේ හදවත් පතුලේ නැගුණ දීප්තිමත් ආලෝකධාරව මෙම චරිත දෙක අතර අසම්මත ප්‍රේමයකට පදනම දැමීය.

"හරිම සුන්දරයි." මහලු කාන්තාව කීවාය. ඇගේ පුතුගේ හැඟීම්ද එයමය. ඒ පියකරු දර්ශනය නොපෙනී යන තුරුම ඔහු බලා හුන්නේය. සිහින් සිනහව ඔහු හැ රදා ගියේ නැත. ඈ සොහොයුරාගේ අතින් අල්ලා උණුසුම් පිළිසඳරක යෙදෙන්නට වූවාය."

ඇනා කැරනිනා, පරිවර්තනය, ස්වර්ණකාන්ති රාජපක්ෂ - 67 පිට

රොන්ස්කි, ඇනා කැරනිනා වෙතින් දකින සුන්දරත්වය ඇය ද ඔහු වෙතින් දුටුවාය. සමාජයේ උසස් පෙළැන්තියකට අයත් තමා මෙන්ම උසස් නිලධාරියකු වන තම සැමියා ද, පුංචි පුතු ද ඇතුළත් වන කැදැල්ලට කිසිඳු අවහිරයක් නොවිය යුතු බව ඇය විටින් විට තම හැඟීම් පාලනයට යොදාගත් අධිෂ්ඨානශීලී උපදේශයයි. එහෙත් තම සැමියාගෙන් තමා නොලබන සැබෑ, සුන්දර ආදරය වෙනත් කෙනෙකු වෙත දකින ඇය ඔහුට ආකර්ෂණය වන්නේ හැඟීම් හා බුද්ධිය සමග දින ගණනක් තිස්සේ කළ සටනක ප්‍රතිඵල වශයෙනි. රොන්ස්කි සමග තම බිරිඳ ඇති කරගෙන තිබෙන පෙම් සබඳතාව නිසා තම පවුලට මෙන්ම තමන් සතු ඉහළ සමාජ තත්වයට ද සිදු වන කැළල නිරන්තරයෙන්ම කැනින්ගේ මනස පෙළන දරුණු වේදනාවකි.

ටෝල්ස්ටෝයි මෙම කතා වස්තුව නිර්මාණයේදී සුබ-අසුබ, යහපත්-අයහපත්, හොඳ-නරක යන, ජීවිතයේ කවරකු වුවද මුහුණ දෙන සියලු පැතිකඩ දෙස මහා අවධානයකින් යුතුව බලා ඇති බව පෙනේ. රොන්ස්කි හා වාසයෙන් තම කුස දරුවකු පිළසිඳගත් පසුව ද සැමියාගෙන් දික්කසාදයට අවසර නොලැබෙන විට ඇනා අන්ත අසරණ තත්වයකට පත් වෙයි. ටෝල්ස්ටෝයි හුදෙක් නවකතාකරුවකු පමණක් නොව මනෝවිශ්ලේෂකයකු ද වන බව නවකතාවේ අවසානයට ළං වන විට පාඨකයාට හැඟෙනු ඇත.

රොන්ස්කිට දාව දියණියක් බිහි කරන ඇනා සැමියාගේ ආයාචනයට ඉඩ දෙමින් ඔහු ජීවත් වන නිවසේම ජීවත් වෙයි. සැබෑ තත්වය ලෝකයාගෙන් වසන් කරගනිමින් තම සමාජ ගෞරවය රැකගැනීමට ප්‍රමුඛත්වය දෙන කැරනින් ජීවිතයේ සාමාන්‍ය ගලා යාම අවුරමින් තම බිරිඳගේ හැඟීම් හඳුනාගන්නට අසමත්ව ක්‍රියා කරයි. සැමියාගෙන් දික්කසාදය නොලැබෙන නිසාම ඇනා ජීවිතයේ අතරමං වෙයි. රොන්ස්කි තමා වෙත දැක්වූ ප්‍රේමය එපරිද්දෙන්ම නොපවතින බවට සැක කරවන අයය මානසික ව්‍යාධියකින්, ආතතියකින් පෙළෙන තත්වයකට පත් වෙයි.
මෙවන් අසරණ ඉරණමකට ලක් වන ගැහැනියක් කවර සමාජයක වේවා, කවර යුගයක වේවා, මුහුණාපාන බේදනීය තත්වය ඇනාගේ චරිතය මගින් ඉස්මතු කර ලීමට කතුවරයා සමත් වී ඇත. සමස්ත විශ්වය පුරාම අඩු වැඩි වශයෙන් දක්නට ලැබෙන යහපත් අන්‍යෝන්‍ය සම්බන්ධතා මෙන්ම ඒ අතරට නොවැළැක්විය හැකි වන අන්‍යෝන්‍ය ඝට්ටනයන් ද ටෝල්ස්ටෝයි තම නිර්මාණය තුළට ඔබ්බවා කලාත්මක ලෙස විවිරණය කිරීමට සමත් වී ඇත.

පැරණි සමාජයේ සාහිත්‍ය කරණයෙහි යෙදුණු ලේඛකයන් විටෙක ගැහැනිය වපල බවත්, පුරුෂයාට අයහපත ගෙන එන්නියක බවත් කීමට උත්සාහ දැරුවද, ඒ අතරම කාන්තාවගේ යථා ස්වරූපය, යහපත් ස්වභාවය හෙළි කර ලීමට යොමු වූ ලේඛකයෝ ද විරල නොවුහ.

"විවාහ ජීවිතයේ යම් නිරාණවලට එළඹෙන්නට තම අඹුසැමි දෙපළ අතර පූර්ණ විරෝධතාවක් හෝ සෙනෙහෙබර එකඟත්වයක් තිබිය යුතුය. සබඳතාව අවිනිශ්චිත නම් කිසිවක් පිළිවෙලට ඉටු කරගන්නට නොහැකිය."

ඇනා කැරනිනා, පරිවර්තනය, ස්වර්ණකාන්ති රාජපක්ෂ - 797 පිට

ටෝල්ස්ටෝයි සිය නිර්මාණයෙන් පළ කළ මෙබඳු අර්ථවත් අදහස් පරිවර්තිකාව (ස්වර්ණකාන්ති රාජපක්ෂ) ප්‍රබල ලෙස සිය පරිවර්තනයෙන් ඉදිරිපත් කිරීමට සමත් වී ඇත. මිනිසුන් හා ගැහැනුන් අතර පවත්නා අන්‍යෝන්‍ය බැඳීඹ හා සම්බන්ධතාවන් සදාකල්හිම එකම තලයක, එකම අයුරින් පැවතීම අපේක්ෂා කළ නොහැකි වන්නට පුළුවන. එසේ නිබියදී හැඟීම්වලට ගොදුරු වෙමින් නොවැළැක්විය හැකි පරිදි අසරණ තත්වයන්ට පත් වන ගැහැණු හා පිරිමි අනන්ත අප්‍රමාණව සිටිති. කෙසේ නමුත් මෙවැනි අවස්ථාවන්හිදී සාමාන්‍යයෙන් වැඩි අසරණ බවකට පත් වනුයේ කාන්තාවය යන්න ද කෙනෙකුට නිතැතින්ම දැනෙන අදහසකි. ටෝල්ස්ටෝයි නම් වූ විශ්ව-සම්භාවිත කලාකරුවා එම තත්වය තම නිර්මාණය තුළින් ඉදිරිපත් කරන්නේ ද නුදු අදහසක් හෝ දෘෂ්ටියක් ලෙස නොවේ. එක් එක් චරිතවල තිබෙන විශේෂ ලක්ෂණ හඳුනාගනිමින් මෙන්ම. පා කයාටද ඒ ගැන අවබෝධයක් ලබාගන්නට ඉඩ පාදා දෙමින් මිනිස් සිතේ සංකීර්ණත්වය කදිමට නිරූපණය කරන්නට ඇනා කැරනිනා කෘතිය මගින් ඔහු සමත් වී ඇත.

ඇනාගේ චරිතය මෙන්ම මෙම නවකතාවට විෂය කරගත් සෙසු කාන්තා චරිත ද පත් වන බැරෑරුම් අවස්ථා විග්‍රහ කරන්නට කතුවරයා යොදාගත් භාෂා ශෛලියත්, අවස්ථා හා සිද්ධි නිරූපණයත් ඔහුගේ නිර්මාණ කෞශල්‍ය විශද කරවයි.

"එදා අඳුර බෝවෙමින් තිබුණේය. ඇනා ඔහු එනතුරු මග බලා සිටියාය. ඔහු ගියේ අවිවාහකයන්ගේ හෝජන සංශ්‍රහයකටය. ඈ ඔහුගේ පුස්තකාලයේ සක්මන් කරමින් සිටියාය. පෙරදින දඹරයේ දී වූ සිදුවීම් ඈ සිහි කැඳවාගත්තාය.+----"

ඇනා කැරනිනා, පරිවර්තනය, ස්වර්ණකාන්ති රාජපක්ෂ - 799 පිට

ජීවිතය පුරා තමන් අපේක්ෂා කළ ආදරය නිසි ලෙස ලබා දුන් රොන්ස්කි වෙත, පළමුව අකැමැත්තෙන් වුවද, පසුව සිය හැඟීම වළට ඉඩ දෙමින්, පෙරළා ආදරය පුද කළ ඇනා කැරනිනා සිය ජීවිතයේ අවසාන භාගය ගෙවනුයේ මනසින් හුදකලා වූ චරිතයක් ලෙසටය. සැමියාගෙන් නොලැබෙන දික්කසාදය රොන්ස්කි සමග විවාහ ජීවිතයට එළඹීමට අයයට මග අවුරයි. ඒ අතරතුර රොන්ස්කිගේ ආදරය පිළිබඳ සැක සංකා අයය තුළට නොනවත්වාම ගලා එයි. එයින් පීඩාවට පත් වන ඇය එක්තරා විදියක උමතු ස්වභාවයකට ද යොමු වෙයි. ගැහැනියකගේ චිත්ත සන්තානයේ පවත්නා සියුමැලි ස්වභාවය මෙන්ම දැඩි ස්වභාවය ද විටින් විට එකිනෙක පරදවා නැගී සිටින ආකාරයත් මිනිස් සබඳතා ඉදිරියේ ගැහැනු පිරිමි දෙකොටසම අසරණ වවන ආකාරයත් ටෝල්ස්ටෝයි මෙම නවකතාව පුරාම කියා දෙන පණිවුඩයයි. එසේ වන හමුත් අවසානයේදී ඒ සියල්ල ඉවසා දරාගත නොහැකිව දුම්රියට පැන දිවි නසා ගන්නා ඇනාගේ චරිතය මගින් කතුවරයා කෙසේ වත් ගැහැනියගේ සිත දුබල තත්වයකට පත් කර ලීමට උත්සාහ නොදරයි.

පැරණි සමාජයේ සාහිත්‍ය කරණයෙහි යෙදුණු ලේඛකයන් විටෙක ගැහැනිය වපල බවත්, පුරුෂයාට අයහපත ගෙන එන්නියක බවත් කීමට උත්සාහ දැරුවද, ඒ අතරම කාන්තාවගේ යථා ස්වරූපය, යහපත් ස්වභාවය හෙළි කර ලීමට යොමු වූ ලේඛකයෝ ද විරල නොවුහ. වත්මන් ලෝකය දෙස බලව විට කාන්තාව සවිබල ගැන්වීමේ උද්යෝගීමත් ප්‍රයත්නය දැකගන්නට ඇත. පීව විද්‍යාත්මකව ගැහැනිය පුරුෂයාගෙන් වෙනස් වීම විනා ඇය ෂතු ශක්‍යතාවල අඩුවක් නොමැති බව වත්මන් විශ්ව සමාජයම අවබෝධ කරගෙන ඇත. ඒ අතරට සාහිත්‍ය කරුවන් කාන්තාවගේ චිත්ත ස්වභාවය නිරූපණයේදී එහි සාධනීය පක්ෂය මෙන්ම සියුමැලි බව ද කලාත්මකව නිරූපණයට යොමු වී ඇත. එවන් ලේඛකයන් අතර රුසියානු සාහිත්‍යයේ ඉහල තැනක වපස්ඛෙන ලියෝ ටෝල්ස්ටෝයිට හිමි වන්නේ ද විශිෂ්ට ස්ථානයකි. ඇනා කැරනිනා නවකතාවේ මුඛ්‍ය චරිතය වන ඇනා මෙන්ම කතා වස්තු තුළ පුළුල් ජාලයක් මෙන් පැතිරි පවත්නා චරිත සමූහය අතර ඩොලි, කිටි වැනි සෙසු චරිත ද විවිධාකාරයෙන් සාර්ථක හෝ අසාර්ථක ඉරණමක් අත් කර ගනියි. සමාජය වූ කලි ගැහැනුන් හා පිරිමින් අතර සහසම්බන්ධතා මුල් කොටගත්, ඒ සමගම ආදරය, සෙනෙහස, වෛරය, ක්‍රෝධය, අසමගිය වැනි විවිධ චර්යාවන්ගෙන් වෙළී ගිය සංකීර්ණ ජාලයකි. එය තුළ කාන්තාවගේ චිත්ත ස්වභාවය මැනවින් හඳුනාගනිමින් රසවත් නිර්මාණ මගින් එම තත්වයන් නිරූපණය කළ ලේඛකයන්ට විශ්ව සාහිත්‍ය ක්ෂෙත්‍රය තුළ ගෞරවනීය තත්වයක් හිමි වනු ඇත. ■